
# Project 93
# 93 වන ව්‍යාපෘතිය

DP EDUCATION

Coding School




LIVEWORKSHEETS

- 92 ව්‍යාපෘතියේදී නිර්මාණය කරගන්නා ලද health care app එකට user ගේ සෞඛ්‍ය තත්වයන්ට අදාල report වල result ඇතුළත් කරගැනීමට නිර්මාණය කරමු.
- මේ සඳහා ඔබ විසින් 92 ව්‍යාපෘතියේදී නිර්මාණය කර අවසන් කරගත් project එකම භාවිතා කර ඉදිරියට සංවර්ධනය කරගන යන්න.
- 92 ව්‍යාපෘතියේදී නිර්මාණය කරගත් variables වලට අමතරව මෙම ව්‍යාපෘතිය සඳහාද එම ස්ථානයේම පහළින් මෙම variables නිර්මාණය කරගන්න.

```
var qId = 0;
var suger;
var presure;
var totalCol;
var ldl;
var hdl;
```

- මෙහිදී අප user ගෙන් ප්‍රශ්න 5ක් අසා ඒ එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු data table එකක ගබඩා කරගැනීම සිදු කරයි.
- ඒ සඳහා අවශ්‍යවන dashboard, quizScreen නැමැති screen දෙක ඔබ සඳහා ලබා දී ඇත. ඒවා භාවිතා කරන්න.
- දැන් අපි ප්‍රශ්න හා ඒවාට අදාළ සම්මත අගයන් ඇතුළත් වන quiz නැමැති data table එක නිර්මාණය කරගමු.
- මේ සඳහා පෙර ව්‍යාපෘතියේදී සිදු කළ ආකාරයටම data tab එක වෙත ගොස් Users table එකට අමතරව "QuizTable" ලෙස data table එකක් නිර්මාණය කරගන්න.

Back to data | Debug view

QuizTable | Visualize Data | Clear table | Import csv | Export to csv

| id | Question | StandardLowLevel | StandardHighLevel | Actions |
|---|---|---|---|---|
| # | enter text | enter text | enter text | Add Row |
| 1 | "What is your blood sugar level?" | 80 | 120 | Edit Delete |
| 3 | "What is your blood pressure?" | 80 | 120 | Edit Delete |
| 4 | "What is your total cholesterol level?" | 200 | 239 | Edit Delete |
| 5 | "What is your LDL level?" | 100 | 139 | Edit Delete |
| 6 | "What is your HDL level?" | 40 | 80 | Edit Delete |

- එම table එක තුළට ගොස් ඉහත ආකාරයට records සියල්ල ඔබ විසින් add row button එක භාවිතා කර add කරගන්න.
- ඉන්පසු user විසින් එක් එක් ප්‍රශ්නයට ලබා දෙන පිළිතුරු අගයන් store කිරීම සඳහා තවත් data table එකක් නිර්මාණය කරගත යුතුය.

LIVEWORKSHEETS

- එය “HealthRecords” ලෙස නම් කරන්න.
- එම table එක 

සඳහා columns පහත පරිදි add කරගන්න.

| Id | UserId | Suger | Presure | TotalCol | LDL | HDL | Actions |
|---|---|---|---|---|---|---|---|
| # | enter text | enter text | enter text | enter text | enter text | enter text | Add Row |

- Table එක නිර්මාණය කරගැනීම පමණක් මෙම අවස්ථාවේදී සිදු කරගන්නා අතර data කිසිවක් manual add කරගැනීම සිදු නොකරයි.
- ඒ ආකාරයට data table දෙක නිර්මාණය කරගැනීමෙන් පසු ප්‍රශ්න ඉදිරිපත් වන හා user විසින් enter කරන values data table එක තුළ store කරන ආකාරය නිර්මාණය සඳහා code කරමු.




- App එකට log වීමෙන් පසු ඔබ සිටින්නේ dashboard screen එක තුළ වේ.
- මුලින්ම ඉහළ ඇති logout button එක මත click කර logout වීමට පහත පරිදි code කරන්න.

```
onEvent("btnLogout", "click", function( ) {
  loggedUserId = "";
  setScreen("Home");
});
```

- මෙහිදී loggedUserId variable එකෙහි store වී ඇති අගය remove කර Home screen එක වෙත යොමු කිරීම සිදු කරයි.
- දැන් Enter to check your health status button එක මත click කළ විට quiz screen එක වෙත යොමු වීමට පහත පරිදි code කරන්න.

```
onEvent("btnLetsTest", "click", function( ) {
  setScreen("quizScreen");
  makeQuestions();
  setText("txtValue", "");
});
```

- මෙහි call කර ඇති makeQuestions(); නැමැති function එක ඉන්පසුව නිර්මාණය කරගන්නා ආකාරය බලමු.

LIVEWORKSHEETS

```
function makeQuestions() {
  setText("txtValue", "");
  readRecords("QuizTable", {}, function(records) {
    setText("question", records[qId].Question);
  });
}
```

- එක් එක් ප්‍රශ්නය බැගින් user වෙත ඉදිරිපත් කරන සෑම අවස්ථාවකම ඒ සඳහා answer ලබා දීමට ඇති txtValue නැමැති text box එකෙහි අගය empty කිරීම සඳහා `setText("txtValue", "");` මෙම block එක භාවිතා කර ඇත.
- ඉන්පසු QuizTable එක read කර ඉහත නිර්මාණය කරගත් qId variable එකෙහි අගයට අදාළ record එකෙහි Question column එකෙහි ඇති value එක question නැමැති lable එකෙහි text එක ලෙස set කරයි.
- මෙම ආකාරය නිර්මාණය කළ විට පළමු ප්‍රශ්නය පමණක් display වීම සිදු වේ.
- අනෙක් ප්‍රශ්න load වීම සඳහා next button එක click කිරීම සිදු කළ යුතුය. එය click කළ විට සිදු විය යුතු දේ code කරමු.

```
onEvent("btnNext", "click", function( ) {
  if(qId == 0)
  {
    suger = getNumber("txtValue");
  }
  else if(qId == 1)
  {
    presure = getNumber("txtValue");
  }
  else if(qId == 2)
  {
    totalCol = getNumber("txtValue");
  }
  else if(qId == 3)
  {
    ldl = getNumber("txtValue");
  }
  qId = qId+1;
  if(qId <= 6)
  {
    makeQuestions();
  }
  if(qId == 4)
  {
    hideElement("btnNext");
    showElement("btnReportSubmit");
  }
});
```

මෙසේ next button එක මත click කළ විට එහි ක්‍රියාකාරීත්වය code කළ පසු user එක් එක් ප්‍රශ්නයට ලබා දෙන අගයන් ඒවාට අදාළ variable තුළ store කරගනී.

- එසේ user inputs variables තුළ store කරගත් පසු submit button එක මත click කළ විට ඒවා HealthRecords data table එක තුළ store කරන ආකාරය පහත පරිදි වේ.

LIVEWORKSHEETS

```
onEvent("btnReportSubmit", "click", function() {
  createRecord("HealthRecords", {UserId:loggedUserId,Suger:suger,Presure:presure,TotalCol:totalCol,LDL:ldl,HDL:hdl}, function(record) {
  });
```

❖ HealthRecords table එකෙහි ඇති,

- UserId column එක සඳහා loggedUserId variable එකෙ value එකත්,
- Suger column එක සඳහා suger variable එකෙහි value එකත්,
- Presure column එක සඳහා presure variable එකෙහි value එකත්,
- TotalCol column එක සඳහා totalCol variable එකෙහි value එකත්,
- LDL column එක සඳහා ldl variable එකෙහි value එකත්,
- HDL column එක සඳහා hdl variable එකෙහි value එකත්,

Pass කර record එකක් create කරන්න.

❖ App එක run කර txtValue textbox එක සඳහා ලබා දෙන values HealthRecords data table එක තුළ store වන බ   ව සනාථ කරගන්න.

LIVEWORKSHEETS